රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 29/95 (III)

මගේ අංකය :- II/706ජ206/56/ඩීජ්/32
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

1998.05.29 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## ත්‍රස්තවාදී බලපෑම් සහිත ප්‍රදේශයන්හි සිවිල් පරිපාලනයේ යෙදී සිටින රාජ්‍ය නිලධාරීන්ට දිරි ගැන්වීමේ දීමනා

1995.09.22 දිනැති අංක 29/95, 1996.05.20 දිනැති අංක 29/95(I) හා 1996.09.11 දිනැති අංක 29/95(II) චක්‍රලේඛ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.

02. පහත නම් සඳහන් බල ප්‍රදේශයන්හි සිවිල් පරිපාලනයේ නියුතු රාජ්‍ය නිලධාරීනට 1997.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/97 (III) න් සංශෝධිත 1997.01.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2/97 නව වැටුප් චක්‍රලේඛ අනුව ඒකාබද්ධ වැටුපෙන් 12 1/2% සමාන දීමනාවක් දිරි ගැන්වීමේ දීමනාවක් වශයෙන් ගෙවීමට රජය තිරණය කර ඇත.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|
| පොලොන්නරුව | 1. මැදිරිගිරිය |
| | 2. ලංකාපුර |
| | 3. දිඹුලාගල |
| | 4. තමන්කඩුව |
| අනුරාධපුරය | 1. නුවරගම් පලාත මධ්‍යම / විලච්චිය |
| | 2. මැදවච්චිය |
| | 3. කැබිතිගොල්ලෑව |
| | 4. පදවිය / වැලිඔය |
| | 5. කහටගස්දිගිලිය |
| | 6. හොරොව්පතාන |
| | 7. නොච්චියාගම |
| | 8. ගලෙන්බිඳුණුවැව |
| | 9. පළුගස්වැව |
| පුත්තලම | 1. කල්පිටිය |
| | 2. වනාතවිල්ලුව |
| | 3. කරුවලගස්වැව |
| මඩකලපුව | 1. සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |

| | |
|---|---|
| අම්පාර | 1. දෙහිඅත්තකණ්ඩිය හැර සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| ත්‍රිකුණාමලය | 1. සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| වව්නියාව | 1. සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| මන්නාරම | 1. සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| යාපනය | 1. සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ<br>2. සියළුම දූපත් |
| කිලිනොච්චි | 1. සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| මුලතිව් | 1. සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| මොණරාගල | 1. සියඹලාන්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |

03. දීමනා ගෙවීම් 1997.01.01 සිට1998.12.31 දින දක්වා හේ ප්‍රදේශයේ ත්‍රස්තවාදී ක්‍රියා නොමැති බවට රජය නිවේදනයක් කරනු ලබන දින හෝ දෙකෙන් පළමුව එළඹෙන දින දක්වා පමණක් ක්‍රියාත්මක විය යුතුය.

04. ස්ථිර සේවයට අයත් නොවන නිලධාරීන් සම්බන්ධයෙන් මෙකී දීමනා ඔවුන් සේවය කරන දින ගණන පදනම් කරගෙන ගෙවිය යුතුයි.

05. අදළ මාසය තුළ නිලධාරියා විසින් ලබා ගන්නා සාමාන්‍ය නිවාඩුවලට සමානුපාතිකව දිරි දීමනා අඩු කළ යුතුය.

06. ත්‍රස්තවාදී බලපෑම් සහිත ප්‍රදේශයන්හි ස්ථිරව සේවය නොකරන, එහෙත් විටින් විට එම ප්‍රදේශයන්හි සේවය සඳහා අනුයුක්ත වන නිලධාරීන්ට , ඔවුන් එසේ අනුයුක්තව සේවය කරනු ලබන දින ගණනට සමානුපාතිකව දීමනාව ගෙවිය යුතුය.

07. අදළ ප්‍රදේශයන්හි සේවය කරන සියළුම රාජ්‍ය නිලධාරීන්ට, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ5/97 හි සඳහන් පෞද්ගලික හදිසි අනතුරු ආවරණ රක්ෂණයට (අනතුරු රක්ෂණයට ) සහ ණය සුරැකුම් රක්ෂණ ක්‍රමයට ඇතුළත් වීමෙන් ඔවුනට ලබා ගත හැකි ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන් අවශ්‍ය පියවර ගත යුතුය.

08. මේ සඳහා අවශ්‍ය වන අතිරේක මුදල් අදළ ආයතනයන්හි සම්පත් තුළින් හෝ වැය ශීර්ෂයන්හි ඉතුරුම්පත්වලින් සපයා ගත යුතුය.

09. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකගත්වය ඇතිව නිකුත් කරන ලදී.

අ.කලේ/පී.ඒ.සේනාරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය